# රත්නපුර දිස්ත්‍රික්කයේ රජමහ විහාර කිහිපයක වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංග පිළිබඳ අධ්‍යයනයක්

එල්.පී. රාමනායක[1], ඩබ්.එම්.ජේ.අනූෂා[2]

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[1]gimhaniramanayaka668@gmail.com, [2]anuwijesinghe14@gmail.com

ප්‍රමුඛ පදඃ රජමහා විහාර, වාස්තු විද්‍යාත්මක අංග

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බහුල ලෙස පැරණි නටඹුන් සහිත ආරාම විහාර සංකීර්ණ බොහෝ වේ. ඒ අතරින් ඉතා වැදගත් ස්ථානයක් උසුලන සංබපාල රජමහා විහාරයත්, තෙරුන් කටුව රජමහා විහාරයත්, රම්බා රජමහා විහාරයත්, පෙන්වාදිය හැකිය. ඒ අනුව මෙම ස්ථාන ත්‍රිත්වයේ වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංග පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම අපේක්ෂා කෙරේ. එහිදී ගොඩනැගිලි ආකෘතින්, කලාත්මක අංග ප්‍රමුඛ කොට ගනිමින් මෙම අධ්‍යයනය සිදු වේ. මෙම පර්යේෂණ මාතෘකාව තුළින් රත්නපුර දිස්ත්‍රික්කයේ ඉතා වැදගත් විහාර ආරාම ත්‍රිත්වයක තොරතුරු සේවීමට හැකියාව ලැබීම අතිශයින්ම වැදගත් කාර්යයක් බවට පත් විය.

## ක්‍රමවේදය

මේ සඳහා ක්ෂේත්‍ර ගවේෂණය මෙන්ම ක්ෂේත්‍ර නොවන ක්‍රමවේදයන් ද භාවිතා කරමින් අධ්‍යනය සිදුකළ අතර එහිදී වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංග ගණනාවක තොරතුරු අනාවරණය කරගැනීමටත්, විවිධ යුග තුළ ඒවා වෙනස්කම්වලට භාජනය වූ ආකාරයත් හඳුනාගැනීමට හැකියාවක් ලැබුණි. ඒ අනුව ඉහත ක්‍රමවේද දෙක යටතේ ඉතා සාර්ථක ලෙස දත්ත එක්රැස් කරගැනීමට අවස්ථාවක් හිමි විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

කොළඹ රත්නපුර පැල්මඩුල්ල පසුකර ඇඹිලිපිටිය මාර්ගයේ පල්ලෙබැද්ද පසුකරගෙන යන විට කොළඹ පාර ආසන්නයේදී ගිරි ශිඛර සහිත කඳුවැටිය පාමුල සංබපාල විහාරය හමු වේ. සම්මත දුර ප්‍රමාණය කොළඹ සිට කිලෝ මීටර් එකසිය හතලිහක් පමණ වේ. භූගෝලීය ලක්ෂණ අනුව අතරමැදි කලාපයට අයත් මුහුදු මට්ටමේ සිට අඩි 800 ක් පමණ උසින් යුත් සංබපාල කඳුවැටිය වියළි දේශගුණයට ආවේණික තුරුලතාවලින් සමන්විත වේ. ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට හා සංබපාල ග්‍රාමසේවා වසමට අයත් වන මෙම රජ මහා විහාරය ස්වභාවික ලෙන් හා පසුව ඉදිකළ විහාර ආරාම ගොඩනැගිලිවලින් සමන්විත මනස්කාන්ත ඓතිහාසික පුදබිමක් සමිත ස්ථානයක් ලෙස සඳහන් කළ යුතුය. මෙය දෙවරක් සඟ සතු කළ විහාරයක් වන අතර යුග තුනක් දැකිය හැකි විහාරයක් වේ. අනුරාධපුර යුගය, මහනුවර යුගය හා මෑත යුගය වශයෙන් මේ විස්තර කළ හැකිය. මෙම භූමියේ ඇතැම් ගල් ලෙන්වල මධ්‍ය ශිලා යුගයට අයත් බලංගොඩ මානවයා ජීවත් වූ බවට ද සාධක හමුවෙයි. පධානඝරවල ප්‍රාථමික අවස්ථාව ගල්ලෙන් බව සඳහන් වේ. එහිදී මෙම විහාර සංකීර්ණය ක්‍රිස්තු පූර්ව 161-137 කාලයේදී දුටුගැමුණු රජු විසින් විජිතපුර සටන ජයගත් පසු තම දසමහා යෝධයන්ට ගම්වර පූජා කරන ලදි. මෙය

වුස්සදේව යෝධයාට හිමි වූ ගම්වරය වේ. මොහු හක් පිඹීමේ හා දුනු ශිල්පයේ අති දක්ෂයකු වූ අතර එම හක් ගෙඩිය ඇඳි ගල් පර්වතය අදට ද පවතී. එය ඉතා නිර්මාණාත්මකව කොටා ඇත. එමෙන්ම චෛත්‍ය, බුදු පිළිම හා දේවාලයක් දක්නට ලැබේ. ඉතා අලංකාර පිවිසුම් දොරටුවක් ද වේ. වුස්සදේව තම ගිහි ජීවිතය අතහැර පැවිදි වී මෙම විහාරය සංඛපාල විහාරය නමින් මහණව ඉදි කළ එකක් වේ. මෙම සංඛය අදටත් නිධන්ව ඇතැයි විශ්වාස කෙරේ. වුස්සදේව රහතන් වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කර ඇති දාගැබක් යැයි සැලකෙන දාගැබක් විහාරයේ සිට කිලෝමීටර් දෙකක් පමණ දුරින් ප්‍රධාන මාර්ගයට ආසන්නව ගල් තලාවක ඉදිකර තිබෙන අයුරු දක්නට ලැබේ. මෙය අද ද වුස්සදේව සොහොන නමින් ජනතාව හඳුන්වනු ලබන අතර නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක්ව විනාශ වී ඇත.

එමෙන්ම මීළඟට තෙරුන් කටුව රජමහ විහාරය පිළිබඳ අධ්‍යයනයේ දී එහි ද වුස්සදේව යෝධයා විසින් කරන ලද විහාරයක් බව අනාවරණය වේ. ගල්කණු සහිත ගොඩනැගිලි, ඉතා පැරණි චෛත්‍යයක් හා උමං මාර්ගයක් දක්නට ලැබේ. ඉදිකිරීම්වල සලකුණු මෙන්ම ඉතා පැරණි නටබුන් රාශියක් දක්නට ලැබේ. ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙය ඇඹිලිපිටියේ සිට මාතර මාර්ගයේ 12ඇළ නම් ගම්මානයට පිවිසීමේ මාර්ගයේ පිහිටා ඇති අතර තෙරුන් කටුව රජමහා විහාරය නමින් ජනයා අතර ප්‍රකට වේ. මෙම ස්ථානය මනා පරිසර කළමනාකරණයත්, ජල කළමනාකරණයත් සිදුකර ඇති ස්ථානයක් වේ.කළු ගලින් හා ගඩොලින් නිමවා ඇති ඉදිකිරීම් තුළින් මනා අවබෝධයක් එම තාක්ෂණයන් පිළිබඳව ලබාගත හැකි ය. මෙහිදී ද වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අංග විශාල වශයෙන් දක්නට ලැබෙන රජමහා විහාරයක් බව පැහැදිලි වේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රම්බා විහාර සංකීර්ණය ඉතා පැරණි රජමහා විහාරයක් වේ. මාතර හම්බන්තොට මාර්ගයේ නෝනාගම හන්දියෙන් හැරී ඇඹිලිපිටිය මාර්ගයේ කිලෝමීටර් දහයක් පමණ පසු කළ විට මාර්ගයේ දකුණු පසින් මෙම දක්නට ලැබේ. වලවේගඟ දකුණු ඉවුර එක් සීමාවක් වන අයුරින් ද, වලවේ ගඟ ලියන්ගස්තොටින් හරවා එන මාමඩල ඇළෙන් ද මෙය සීමා වේ. මෙහි සීමාව වශයෙන් උතුරින් වලවේ ගඟත්, බටහිරින් හා දකුණෙන් මාමඩල ඇළ ද වේ. නැගෙනහිරින් වැලිපාර නම් මාර්ගය ද පිහිටා තිබේ. දැනට අනාවරණය කරගෙන ඇති පරිදි අක්කර 250 ක පමණ ප්‍රදේශයක නටඹුන් විසිර පවතී. මෙය පෙරදී සම්බා විහාරය වශයෙන් ව්‍යවහාර කර ඇති අතර පසු කාලීනව එය රම්බා විහාරය වශයෙන් ප්‍රචලිතව ඇත. මෙහිදී වාස්තුවිද්‍යාත්මක නිර්මාණ රාශියක් හමු වන අතර ගොඩනැගිලි සංකීර්ණ විසි හයක් වේ. බොහෝ දුරට මේවා ගඩොල් හෝ ගල් ප්‍රාකාර මගින් වටවී ඇත. සඳකඩ පහණ, මුරගල්, කොරවක් ගල්, ආදී කලාත්මක අංග වශයෙන් හඳුනාගත හැකි අතර සඳකඩ පහණ ඉතා චාම් ලෙස නිමවා ඇත. දැනට ගොඩනැගිලි අතර බෝධිඝර, ස්ථූප, පොහොය ගෙවල්, පිළිම ගේ යන අංගවලින් සමන්විත වේ.

මේ අනුව මෙය අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන කරුණු කාරණා මතුව තිබේ. විශාල ගල් කණු සහිත ගොඩනැගිල්ලක් විහාරයට ඇතුල් වීමේදී ම දක්නට ලැබේ. සන්නිපාත ශාලාව සඳහා කැටයම් සහිත කැසිකිලි ගල් ද හමුව ඇති අතර වැසිකිළි ද දක්නට ලැබේ. එමෙන්ම ගඩොලින් නිර්මාණය කරන ලද අඩි 25 ක් පමණ ගැඹුරැති ළිඳක් ද තිබේ. ගඩොල්වල ප්‍රමාණය අනුව ඒවා අනුරාධපුර යුගයේ අවසාන

භාගයට අයත් බව පැහැදිලි වේ. මෙම රජමහා විහාර ත්‍රිත්වය ඉතා ඉපැරැණි විහාර ආරාම සංකීර්ණ වන අතර යුගකරණය තුළ තරමක් සමානකම් දක්නට ලැබේ. කලාත්මක අංග හා වාස්තුවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සුළු වෙනස්කම් දක්නට ඇති අතර මෙම විහාර ආරාම ත්‍රිත්වය තුළ ඉතා හොඳ කළමනාකරණයක් දක්නට ලැබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


දොඩම්වල, ගාමිණී.(2009)*රුහුණු රම්බා විහාරය*.කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.